# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## පළමු වාර පරීක්ෂණය - 2011

## බුද්ධ ධර්මය I

**6 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න'

1. සිදුහත් කුමරු මෙලොවට බිහිවූයේ

i) ක්‍රි.පූ. 5 වන සියවසේ ii) ක්‍රි. පූ. 6 සියවසේ

iii) ක්‍රි. පූ. 7 වන සියවසේ iv) ක්‍රි. පූ. 8 වන සියවසේ

2. සිදුහත් කුමරු ඉපදුනේ................................................පොහොය දිනයේදීය.

i) දුරුතු ii) වෙසක් iii) පොසොන් iv) ඇසල

3. සිදුහත් කුමරුට නම් තැබීමට පැමිණි බමුණන් සංඛ්‍යාව

i) 8 ii) 48 iii) 108 iv) 208

4. සිදුහත් කුමරු අනිවාර්යයෙන්ම බුදුවන බව ප්‍රකාශ කළ බමුණා,

i) රාම ii) ධජ iii) කොණ්ඩඤ්ඤ iv) ලක්ඛණ

5. සිදුහත් කුමරු උගත් ශිල්පයක් නොවන්නේ,

i) වේදය ii) රාජ නීතිය iii) කඩු ශිල්ප iv) රංග ශිල්පය

6. සතර පෙර නිමිති දැකීමෙන් සිදුහත් කුමරු තුළ ශාන්ත නිවුන හැඟීමක් ජනිත කළ පෙර නිමිත්ත

i) මහල්ලෙක් ii) ලෙඩෙක් iii) මලමිනියක් iv) පැවිදි රුවක්

7. සිදුහත් කුමරු ගිහි ගෙය හැර ගියේ ....................පොහොය දිනයකය

i) වෙසක් ii) පොසොන් iii) ඇසළ iv) බිනර

8. අභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් බෝසතාණන්ට සිවුරු පාත්‍ර පූජා කළේ,

i) ඝටිකාර බ්‍රහ්මයා ii) සොත්ථිය බමුණා

iii) කොණ්ඩඤ්ඤ බමුණා iv) උපක ආජීවක

9. සිදුහත් තාපස තුමාගේ ගුරුවරයෙකු වන්නේ,

i) සර්වමිත්‍ර බමුණා ii) ආලාරකාලාම බමුණා
iii) අසිත බමුණා iv) කොණ්ඩඤ්ඤ බමුණා

10. සිදුහත් තාපසතුමා උද්දකරාම පුත්ත තවුසා වෙතින් ලබා ගත්තේ,

i) ආකිඤ්චඤ්ඤායතනය ii) විඤ්ඤාණඤ්චායතනය

iii) ආකාසානඤ්චායතනය iv) නේවසඤ්ඤා නාසඤ්ඤායතනය

11. සිදුහත් තවුසාණන් දුෂ්කර ක්‍රියා කල කාලය වසර,

i) 4 කි. ii) 6 කි. iii) 8 කි. iv) 10 කි.

12. බුදුවන අවස්ථාවේදී පැමිණි මාරසේනා ගණන වන්නේ,

i) 5 කි. ii) 10 කි iii) 15 කි iv) 20 කි

13. අනිමිස ලෝචන පූජාව සිදුකලේ බුද්ධත්වයෙන් ................

i) පළමු සතියේය ii) දෙවන සතියේය iii) තෙවන සතියේ iv) සත්වන සතියේය

14. බුදුන් වහන්සේ සරණ ගිය ප්‍රථම ද්වේවාචක උපාසක වරු වනුයේ

i) බරණැස් සිටුතුමා හා බිරිඳ ii) යසකුල පුත්‍රයා හා බිරිඳ

iii) තපස්සු භල්ලුක iv) ගවම්පති පුණ්ණජි

15. බුදුගුණ කීය ද?

i) 7 කි. ii) 9 කි. iii) 18 කි iv) 24 කි.

16. බුදුන් වහන්සේට අරහත් යනුවෙන් පවසන්නට හේතුවක් නොවනුයේ මින් කුමක්ද?

i) රහසින් වත් පවු නොකළ නිසා ii) පුද පූජාවන්ට සුදුසු වූ නිසා

iii) සියලු කෙලෙස් දුරු කළ නිසා iv) විද්‍යා ඥාණ 8 ක් ඇති නිසා

17. බුදුරජාණන් වහන්සේගේ දින චරියාවේ රාත්‍රී කාලයට අයත් නොවන කාර්යය වන්නේ,

i) පසුබත් කිස ii) පෙරබත් කිස iii) මැදියම් කිස iv) පැසුළු යම් කිස

18. අධිපතිධර්ම වලට අයත් නොවේ,

i) ශාස්ත්‍රාධිපති ii) අත්තාධිපති iii) ලෝකාධිපති iv) ධම්මාධිපති

19. කුසල මූලයක් වන්නේ,

i) ලෝභ ii) ද්වේශ iii) අද්වේෂ iv) මෝහ

20. 2600 සම්බුද්ධත්ව ජයන්තිය යනු,

i) සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගෙන වසර 2600 ක් ගත වූ බවයි.
ii) සිදුහත් කුමරු ඉපදී වසර 2600 ක් ගත වූ බවයි.
iii) සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කර වසර 2600 ක් ගතවූ බවයි.
iv) සිදුහත් කුමරු බුද්ධත්වයට පත් වී වසර 2600 ක් ගත වූ බවයි.

# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## පළමු වාර පරීක්ෂණය - 2011

## බුද්ධ ධර්මය II

**6 ශ්‍රේණිය**

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. විද්‍යාලයීය බෞද්ධ අංශය මගින් සංවිධානය කර තිබූ සංඝගත දක්ෂිණාව ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   1) ඉහත ක්‍රියාකාරකම සඳහා ඔබ දායක වූ ආකාර 2 ක් ලියන්න.
   2) එම ක්‍රියාකාරකමෙහි යෙදීමේදී ඔබට ඇති වූ බාධා 2 ක් ලියන්න.
   3) එම ක්‍රියාකාරකමෙහි නියැලීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 2 ක් ලියන්න.
   4) දානමය පුණ්‍ය කර්මයකදී කළ යුතු වතාවත් පිළිවෙලින් 4 ක් ලියන්න.

2.

   1) සත් පියුම් මත වැඩි සිදුහත් කුමරු ප්‍රකාශ කළ උදාන වාක්‍ය ලියන්න.
   2) එහි අරුත පහදන්න.

3.

   1) සිදුහත් බෝසත් සිරිතෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.
   2) ඉන් ආදර්ශ 2 ක් සඳහා බෝසත් සිරිතන් උදාහරණ ලියන්න.

4.

   1) ත්‍රිවිද්‍යා නම් කරන්න.
   2) එහි තේරුම ලියන්න.

5.

   1) නව අරහාදී බුදු ගුණ ලියන්න.
   1) තුන් කල්හිම පැවති .................කවිය සම්පූර්ණ කරන්න.